සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 7 - 2019

**නම : ..............................................** **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය : පැය 02 යි.**

වැදගත් :

l ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

## I කොටස

l **1 හා 2 ප්‍රශ්නවල තද කළු අකුරින් දැක්වෙන යෙදුම් වෙනුවට ගැළපෙන රූඩියක් තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) පාසලට නොයා ගෙදර සෙල්ලම් කරමින් සිටින නිමල්ට පාරේ යමින් සිටි පන්ති භාර ගුරුතුමා දැකීමෙන් **අනපේක්ෂිත ගැටලුවකට මුහුණ දීමට** සිදුවිය.

(i) කරල පැහුණා (ii) ඉහේ මලක් පිපුණා

(iii) කොටි වලිගෙ අල්ලා ගත්තා (iv) තරු පෙනුණා

(2) බස් රථය ප්‍රපාතයට නොයා **අවසාන මොහොතේ** බේරා ගන්නේ රියදුරාගේ දක්ෂතාවයෙනි.

(i) කරල පැහුණා (ii) ඉහේ මලක් පිපුණා

(iii) කොටි වලිගෙ අල්ලා ගත්තා (iv) තරු පෙනුණා

l **අංක 03, 04 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාස සහිත වචනය තෝරන්න.**

(3) (i) ප්‍රාගුන්‍යය (ii) කරීකාචාර්ය (iii) නිස්සාරනය (iv) ජ්‍යෝතිශ්සාස්ත්‍රය

(4) (i) ආස්වාදය (ii) නිශ්ඵල (iii) විශ්මය (iv) කැළණිය

l **අංක 05 සිට 10 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(5) ක්‍රියා විශේෂණයකට උදාහරණ ලෙස ගත හැකි පිළිතුර තෝරන්න.

(i) සිල්වත් භික්ෂුව (ii) පැහැදිලිව ලිවේය

(iii) ගෙදර ගියේය (iv) දක්ෂ ශිෂ්‍යයා

(6) දී ඇති වාක්‍යාංශයට ගැළපෙන තනි පදය තෝරන්න.

**තමා ගැන පමණක් සිතා කටයුතු කරන්නා.**

(i) මසුරු (ii) දුර්ජන

(iii) ආත්මාර්ථකාමී (iv) පරහිතකාමී

(7) පූර්ව ක්‍රියා පදයකට උදාහරණ ලෙස ගත හැකි පිළිතුර වන්නේ,

(i) කපති (ii) ලිය ලියා

(iii) නෙළා (iv) බලමින්

(8) මධ්‍යම පුරුෂ බහුවචන නාම පදයක් වන්නේ,

(i) ඔවුහු (ii) තොපි

(iii) අපි (iv) කුරුල්ලෝ

(9) සාමාන්‍ය ව්‍යවහාරයේ යොදා ගන්නා ගොයම් කැපීමෙන් පසු ගොයම් ගසේ ඉතිරි කොටස කමත් භාෂාවේ හඳුන්වන්නේ,

(i) ලියන්නාව (ii) උප්පිඩ

(iii) අත්තම (iv) ඉපනැල්ල

(10) 'සසර වසන තුරු - නිවන් දකින තුරු' යන දේශාභිමානී ගීතයේ රචකයා වන්නේ,

(i) ඩොල්ටන් අල්විස් (ii) අරිසෙන් අහුබුදු

(iii) මහගමසේකර (iv) සුනිල් ආරියරත්න

l අංක 11 හා 12 ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන ආඛ්‍යාතය වරහන තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(11) කාර්මික ශිල්පීහු නව නිර්මාණ සඳහා පර්යේෂණවල ..........................................
(යෙදෙයි/ යෙදෙති/ යෙදෙනු ලබයි)

(12) විහාර මහා දේවිය දුටුගැමුණු කුමාරයාට උපදෙස් ..........................................
(දුන්නේය/ දෙයි/ දුන්නාය)

l විරුද්ධාර්ථ පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(13) අන්ත (අන්තර, සමාන්තර, අනන්ත, දුර්දාන්ත)

(14) මෛත්‍රී ( නින්දාව, වෛරය, කරුණාව, ද්වේෂය)

(15) උපසර්ගයක් යෙදී නැති පිළිතුර තෝරන්න.

(i) අවගුණය (ii) දුසිරිත්

(iii) හීනමානය (iv) අනුගමනය

(16) සිරිපා වඳින්නට නොගිය රජතුමා වන්නේ,

(i) දුටුගැමුණු (ii) පණ්ඩිත පරාක්‍රමබාහු

(iii) වළගම්බා (iv) බෝසත් විජයබාහු

l කෙටි පිළිතුරු ලියන්න.

(17) තොප්පි වෙළෙන්දා වේදිකා නාට්‍ය කාගේ නිර්මාණයක් ද? ..........................................................................................

(18) 'මගේ විශ්ව විද්‍යාලය මහජන පුස්තකාලය යි'' යන ප්‍රකාශය කරන ලද අපේ රටේ බිහි වූ විශිෂ්ට ලේඛකයාගේ නම කුමක් ද? ..................................................................................................

(19) ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
නිසි කලට කෙනෙකුට - කළ උපකාර වූ නම්
..........................................................................................................................................................

(20) විරාම ලකුණු නිවැරදිව යොදන්න.
ඇයි කුමක් කියමු ද මම ගොවියා පුතු නො වැන්දෙමි.

(ලකුණු 2 x 20 = 40)

# II කොටස

ⅰ පළමු, දෙවන හා තෙවන ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

(01) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) මිශ්‍ර සිංහල හෝඩියේ මහා ප්‍රාණ අක්ෂර කීයද? ඒවා ලියා දක්වන්න.

(ii) සංස්කෘත හා දෙමළ උපදේශ කාව්‍යයන්ගෙන් පෝෂණය වූ සිංහලයේ හමුවන උපදේශ කාව්‍ය අතරින් දෙකක නම් ලියන්න.

(iii) පහත දැක්වෙන පොත් රචනා කරන ලද රචකයන්ගේ නම ලියන්න.

1. අඹ යාළුවෝ -
2. හීන් සැරය -

(iv) අරුත් පැහැදිලි කරන්න.

1. නියං සමය
2. සහ ජීවනය

(v) දිලිහි දිලිහි ආකාසේ බබළන මල් තාරුකා
බැබළි බැබළි ආකාසේ දිලිසෙන මල් තාරුකා

..........................................................................................................................................

.......................................................................................................................................... (ලකුණු 10)

(02) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන රචනයක් ලියන්න.

(i) දහම් පාසල් අධ්‍යාපනයේ අගය

(ii) සඳ පහන් රැයන අසිරිය

(iii) වැඩිහිටියන් රැක බලා ගනිමු.

(iv) ''කියවීම මිනිසා සම්පූර්ණ කරයි'' (ලකුණු 20)

(03) ඔබේ පාසලේ පරිසරය සුරකිමු සංවිධානයේ ලේකම් ඔබ යයි සිතන්න. මේ දිනවල නැවත වරක් ඩෙංගු රෝගය පැතිර යමින් පවතී. පාසලේ දරුවන්ට ඩෙංගු රෝගය පිළිබඳව කරුණු පැහැදිලි කරදීම සඳහා සුදුසු නිළධාරි මහතෙකු සහභාගි කරවීමට කටයුතු කරන මෙන් ඉල්ලා විදුහල්පතිතුමා මගින් ප්‍රදේශයේ සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා වෙත යැවීමට සුදුසු රාජකාරි ලිපිය ලියන්න. (ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ශ්‍රී ලංකාවාසී ජනතාව මුදුන් මලකඩක් වැනි වූ සමනල කන්ද ආගමික මෙන් ම ජාතික වශයෙන් ද වැදගත් වේ. මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුමෙහි වූ මේ කඳුවැටිය ශ්‍රී ලංකාවාසීන්ගේ වන්දනීය ස්ථානයකි. සමනල පර්වතයට අධිගෘහිත සුමන සමන් දෙවි රජුන්ගේ ආරාධනයෙන් වම් ශ්‍රී පාදය සුමන කූට මස්තකයෙහි පිහිටුවීමත් සමඟ මේ ස්ථානය ගෞරව බැති වන්දනාමානයට පත්ව ඇත. පාහියන් භික්ෂුව ලියූ වාර්තාවකින් බුදු රදුන්ගේ වම් සිරි පතුල සමනල ගිර මත පිහිටා ඇතැයි සැලකේ. රොබට් නොක්ස්ගේ ග්‍රන්ථයෙන් ද මේ බව සනාථ වෙයි. විජය කුමරු තම දරුවන් හා කුවේණිය පිට මං කළ විට ඇගේ දරුවන් දෙදෙනා සුමන කූටයට ගිය බව මහාවංශයේ සඳහන් වේ.

(i) ඡේදයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද?

(ii) මෙය ගෞරව බැති වන්දනාමානයට පත්ව ඇත්තේ කුමක් හේතුවෙන් ද?

(iii) බුදුන්ගේ වම් සිරි පතුල පිහිටුවා ඇතැයි යන මතය සනාථ කිරීමට ඇති සාක්ෂි දෙක ලියා දක්වන්න.

(iv) විජයගේ දරු දෙදෙනා මෙම ස්ථානයට ගිය බව සඳහන් වන ග්‍රන්ථය කුමක් ද?

(v) මෙම වචනවල තේරුම ලියන්න.

(අ) අධිගෘහිත - ......................................................

(ආ) මස්තකය - ...................................................... (ලකුණු 2 x 5 = 10)

(05) මෙම වාක්‍යය නිවැරදි කර ලියන්න.

(i) ශිෂ්‍යයන් අමුත්තෝ ශාලාවට කැඳවා ගෙන ආවෝ ය.

(ii) දූ දරුවන් මහලු මවුපියෝ රැක බලා ගනිති.

(iii) තුරුලතා මහා වැස්සෙන් ජීවය ලබති.

(iv) නුඹ මෙවර විභාගයට හොඳින් සූදානම් වූයෙහු ද?

(v) ඔවුන් අපට උපකාර කිරීමට ඉදිරිපත් වූහ. (ලකුණු 2 x 5 = 10)

(06) පහත දැක්වෙන උද්ධෘත ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

(i) ''මම මඩොල් දූව නවකතාව කියවා වින්දනයක් ලැබුවා''

(ii) මේ ළමයෝ නිකං ඉන්න
අපරාදෙ ඇදල දාන්නෙ
ඕව උඹට අරන් දෙන්න
මා ළඟ මිල මුදල් කොයි ද?

(iii) 'ඇයි මැණියනි, මම කුමන අන්‍යායවක් කෙළෙම් ද '' යි කීය.

(iv) ''කම්මැළි රාල! මම වැඩ පටන් ගත්තා විතර යි''

(v) 'ඒක හොඳයි, නැත්නම් දෙමළ අයට තේරෙන්නේ නැහැනේ,''

| පාඩමේ නම | කීවේ කවු ද? | කාහට කියන ලද්දක් ද? |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |
| (v) | | |

(ලකුණු 2 x 5 = 10)

Anwer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 7 - 2019

### සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. iv | 06. iii | 11. යෙදෙති | 16. දුටුගැමුණු |
| 02. iii | 07. iii | 12. දූන්නාය | 17. සෝමලතා සුබසිංහ |
| 03. ii | 08. ii | 13. අනන්ත | 18. ජී. බී. සේනානායක |
| 04. i | 09. iv | 14. වෛරය | 19. එය ඉතා සුළු වුව මහා ලොවටත් වැඩි විශාලයි. |
| 05. ii | 10. i | 15. හීනමානය | 20. 'ඇයි? කුමක් කියමු ද? මම ගොවියා පුතු නොවැන්මි. |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (i) 18 යි.
අ, ආ, ඇ, ඈ, ඉ, ඊ
උ, ඌ, ඍ, ඎ, ඏ, ඐ
එ, ඒ, ඓ, ඔ, ඕ, ඖ
(ii) ලෝවැඩ සඟරාව, ලෝකෝපකාර සුභාෂිතය
(iii) ටී. බී. ඉලංගරත්න මහතා
කුමාරතුංග මුනිදාස මහතා
(iv) ඉඩෝරය - වර්ෂාව නොමැති කාලය
සහජීවනය - සහයෝගයෙන් ජීවත් වීම
(v) ගන්ටත් බෑ දෙන්ටත් බෑ පුංචි රුවන් තාරුකා (ලකුණු 2 x 5 = 10)

02. දී ඇති මාතෘකාවට අනුව කරුණු ලියා ඇත්නම්, ආරම්භය හා අවසානය ක්‍රමානුකූලව ගළපා තිබේද යන්න සැලකිල්ලට ගනිමින් ලකුණු ලබා දෙන්න. (ලකුණු 20)

03. රාජකාරී ලිපියක ආකෘතිය, අන්තර්ගතය, ශිල්පීය දක්ෂතා යන කරුණු නිවැරදිව ඇත්නම් අදාළ ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

04. (i) සමනල කන්ද පිලිබඳව
(ii) බුදුන්ගේ ශ්‍රී පාද ලාංඡනය පිහිටුවීම නිසාය.
(iii) 1. රොබට් නොක්ස්ගේ ග්‍රන්ථය
2. පාහියන් භික්ෂුවගේ වාර්තාව
(iv) මහා වංශය
(v) අයිති/ අරක්ගත් මුදුන (ලකුණු 2 x 5 = 10)

**Anwer**

05. (i) ශිෂ්‍යයෝ අමුත්තන් ශාලාවට කැඳවා ගෙන ආවෝ ය.
(ii) දූ දරුවෝ මහලු මවුපියන් රැකබලා ගනිති.
(iii) තුරුලතා මහා වැස්සෙන් ජීවය ලබති.
තුරුලතාවෝ මහා වැස්සෙන් ජීවය ලබති.
(iv) නුඹ මෙවර විභාගයට හොඳින් සූදානම් වූයෙහි ද?
(v) ඔවුහු අපට උපකාර කිරීමට ඉදිරිපත් වූහ. (ලකුණු 2 x 5 = 10)

| | පාඩමේ නම | කීවේ කවු ද? | කාහට කියන ලද්දක් ද? |
|---|---|---|---|
| (i) | පුස්තකාලයට පියනගමු. | සුධීර | ගුරුතුමියට |
| (ii) | තොප්පි වෙළෙන්දා | ළමයාත් අම්මා | ළමයා |
| (iii) | තිලමුට්ඨී ජාතකය | දිසාපාමොක් ආචාරී | මහලු ස්ත්‍රියට |
| (iv) | ගොවි බිරියගේ නුවණ | ගොවි බිරිය | ගොවියාට |
| (v) | නිවේදන | අසිත | මුදිතට |

(ලකුණු 2 x 5 = 10)